# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,551 - 2008 මැයි මස 23 වැනි සිකුරාදා - 2008.05.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 580 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 580 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 586 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2008 මාර්තු මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී .

(ii) ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 මාර්තු මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මැයි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**රා තැබෑරුම් රේන්ද විකිණීම - 2008/2009 වර්ෂය**

වර්ෂය 2008 ජූලි සිට 2009 ජූනි දක්වා කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

2008 ජූලි 01 සිට 2009 ජූනි 30 දක්වා මාස 12ක කාලයක තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාලව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත දැක්වෙන උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබා ගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනෙහි වම් කෙලවරෙහි අංක ................................දරන ......................................... 'රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය' වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2008.05.22 වැනි දින පෙ.ව. 10.00ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වෙලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.02 දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2008.05.30 වැනි දින පෙ.ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2008.06.10 දින පෙ. ව. 10.00ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

එම්. එච්. එම්. රියාල්දීන්,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම්* | *ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2008.05.30 පෙ.ව. 10.00 | රු. 1,000 |
| 02. | කල්පිටිය | ඊත්තාලේ | රා | 2008.05.30 පෙ. ව. 10.00 | රු. 1,000 |

05-336

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

නිට්ටඹුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩබ්ලිව්. පී. හේමන්ත විසින් 2008.03.19 වැනි දින ලියා සහතික කරන ලද අංක 139 ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාර 175, පහලවත්ත, මීගමුපාර නිට්ටඹුව පදිංචි රාජපක්ෂ විතානගේ සුමතිපාල වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

රාජපක්ෂ විතානගේ සුමතිපාල.

05-428

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ ය**

අංක 475/32, කෝට්ටේ පාර, රාජගිරිය යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, ලියාපදිංචි අංක පී. වී. 63584 දරන ගෝ රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2008 මාර්තු මස 26 වැනි දින සංස්ථාපනය කළ බවට දැනුම් දීමයි.

අධ්‍යක්ෂකවරු.

05-462

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් පිළිබඳ දැන්වීම

සමාගමේ නම : ඔකායා ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ;
සමාගමේ අංකය : පී. වී. 63656;
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 212, ද සේරම් පෙදෙස, කොළඹ 10.

ඉහත සමාගම වෙනුවෙන් මැනේජර්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 212, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

ලේකම්වරු.

05-415/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් පිළිබඳ දැන්වීම

සමාගමේ නම : තායි ෂයින් කන්ස්ට්‍රක්ෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ;
සමාගමේ අංකය : පී. වී. 63569;
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 212, ද සේරම් පෙදෙස, කොළඹ 10.

ඉහත සමාගම වෙනුවෙන් මැනේජ(ර්)ස් ඇන්ඩ් සෙක්‍රටරීස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 212, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

ලේකම්වරු.

05-415/2

---

## නිවේදනයයි

රබීනා ෆඩ් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2007 අප්‍රේල් මස 24 වන දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රබීනා ෆඩ් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ;
සමාගමේ අංකය : පී. වී. 63909;
ලියාපදිංචි කාර්යාලය : අංක 90, රෙක්ලමේෂන් පාර, කොළඹ 11.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමටඩ්.
(පි. වී. 259)

සමාගම් ලේකම්වරු.

05-416

## නිවේදනයයි

ග්ලෝබල් පාට්නර් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2007 මැයි මස 08 වන දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්ලෝබල් පාට්නර් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ;
සමාගමේ අංකය : පී. වී. 64029;
ලියාපදිංචි කාර්යාලය : අංක 97, ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමටඩ්.
(පි. වී. 259)

සමාගම් ලේකම්වරු.

05-417

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම අපි දැනුම් දෙන්නෙමු

සමාගමේ නම : සුනෙලා ජයවර්ධන එන්වයරන්මන්ටල් ඩිසයින් (ප්‍රයිවට්)
ලියාපදිංචි ලිපිනය : 'හයිබරි'', අංක 218, බුලර්ස් පාර, කොළඹ 07
සමාගමේ අංකය : PV63128
සංස්ථාගත කිරීමේ දිනය : 2008 පෙබරවාරි මස 21 වැනි දින.

සමාගමේ නම : කාල්ගරි ඩිවලොපර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 535/5, නාවල පාර, නාවල, රාජගිරිය
සමාගමේ අංකය : PV63380
සංස්ථාගත කිරීමේ දිනය : 2008 මාර්තු මස 8 වැනි දින

සමාගමේ නම : එලිගන්ට් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : 717 C, 3 වන මහල, තලවතුගොඩ පාර, බත්තරමුල්ල.
සමාගමේ අංකය : PV63504
සංස්ථාගත කිරීමේ දිනය : 2008 මාර්තු 18 වැනි දින

සමාගමේ නම : ඉලෙක්ට්‍රෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 7A, එස්තර් පෙදෙස, පාර්ක් පාර, කොළඹ 05
සමාගමේ අංකය : PV63566
සංස්ථාගත කිරීමේ දිනය : 2008 මාර්තු මස 25 වැනි දින

ප්‍රොෆෙසනල් එසයින්මන්ට්ස් ඇන්ඩ්,
සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සෙක්‍රට්‍රීස්.

2008 මාර්තු මස 31 වැනි දින.

05-467/1

**දැන්වීම**

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම අපි දැනුම් දෙන්නෙමු.**

සමාගමේ නම : අෂාන් ගාර්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : වල්ගම පාර, ගමන්පිල, බණ්ඩාරගම
සමාගමේ අංකය : PV62332
සංස්ථාගත කිරීමේ දිනය : 2007 දෙසැම්බර් මස 10 වැනි දින

සමාගමේ නම : එස් ජී සී ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 184, ඇල්විටිගල මාවත, කොළඹ 08
සමාගමේ අංකය : PV62805
සංස්ථාගත කිරීමේ දිනය : 2008 ජනවාරි මස 24 වැනි දින

සමාගමේ නම : යීල්ඩ් සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 157 A/1, කින්සි පාර, කොළඹ 08
සමාගමේ අංකය : PV62851
සංස්ථාගත කිරීමේ දිනය : 2008 ජනවාරි මස 29 වැනි දින

ප්‍රොෆෙසනල් එසයින්මන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
සෙක්‍රට්‍රීස්.

2008 මාර්තු 31 වැනි දින.

05-467/2

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පුත්තලම් දිස්ත්‍රික්කයේ, කාක්කපල්ලිය මරදන්කුලමේ පදිංචි වන ගබ්‍රියල් ප්‍රනාන්දු සංක ලක්මාල් ප්‍රනාන්දු වන මම ඉහත කී ලිපිනයේ පදිංචි ගබ්‍රියල් ප්‍රනාන්දුගේ දුශාන් කපිල ප්‍රනාන්දු මහත්මයාට හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. ස්විනි පෙරේරා මහතා විසින් සහතික කරන ලද 2006.01.12 සහ 5091 අංක දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියළු බලයලත් එම ඇටෝර්නි පත්‍රයත් අද දිනවන 2008.04.08 මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍ර මගින් ගබ්‍රියල් ප්‍රනාන්දුගේ දුශාන් කපිල ප්‍රනාන්දු මහතා කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ගබ්‍රියෙල් ප්‍රනාන්දු සංක ලක්මාල් ප්‍රනාන්දු

2008 අප්‍රේල් මස 08 වැනි දින.

05-429

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ටී. එස්. ආබ්ඩීන් බ්‍රදර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63181
ලියාපදිංචි කළ දිනය : 2008.02.27
ලියාපදිංචි ලිපිනය : අංක 14-16, කෙළින් වීදිය, පුත්තලම

සමාගමේ නම : ස්ට්‍රැත්ෆීල්ඩ් සෙන්ටර් ඔෆ් ලර්නිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63598
ලියාපදිංචි කළ දිනය : 2008.03.27
ලියාපදිංචි ලිපිනය : අංක 638/B, ගාලු පාර, තල්පුරුව, පානදුර

සී ජ් එස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

05-403

---

**සමාගමේ නාමය වෙනස් කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ දැන්වීම

සී අයි සී ෆර්ටිලයිසර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමේ නාමය සී අයි සී ඇග්‍රි බිස්නසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යනුවෙන් වර්ෂ 2008 අප්‍රේල් මස 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ විස්තර පහත පරිදි වේ :

කලින් නාමය : සී අයි සී ෆර්ටිලයිසර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 2264
ලියාපදිංචි ලිපිනය : අංක 205 1/1, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10
නව නාමය : සී අයි සී ඇග්‍රි බිස්නසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

පී. එස්. සී. ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ/ලේකම්.

සී අයි සී ඇග්‍රි බිස්නසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

05-411

---

**නිවේදනයයි**

පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ පැරණි නාමය : ක්‍රීට් එඩියුකේෂනල් ට්‍රේනින් ඇන්ඩ් එම්ප්ලොයිමන්ට් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : ක්‍රියේට් එඩියුකේෂනල් ට්‍රේනින් ඇන්ඩ් එම්ප්ලොයිමන්ට් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : එන් (පීවීඑස්) 47442
ලියාපදිංචි කාර්යාලය : 4 වන මහල, 353, මහ වීදිය, බණ්ඩාරවෙල

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පීවී. 259
සමාගම් ලේකම්වරු.

05-418

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අරුණ රොහාන් ගමලත් මහතා විසින් වර්ෂ 1995 ක් වූ සැප්තැම්බර් මස 16 වන දින ලියා සහතික කරන ලද අංක 838 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව සරත්චන්ද්‍ර සමරසිංහ යන අය විසින් හෝමාගම, පිටිපන, අංක 212 දරන ස්ථානයේ පදිංචි මඩපාත කන්කානමලාගේ කල්‍යාණි සුහසිංහ විවාහයට පසුව සමරසිංහ යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන ලදබව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

සරත්චන්ද්‍ර සමරසිංහ.

05-396

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ දැන්වීම

සංස්ථාගත කළ දිනය : 2008.03.26
සමාගමේ නම : ඉන්ඩෝ සියම් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 63579
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 34, බී. ඕ. අයි. කර්මාන්ත කලාපය, පල්ලේකැලේ, මහනුවර

ලේකම්වරු,
කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

05-397

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි

සමාගමේ නම : සිළුනි ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63999
සමාගම සංස්ථාපනය කළ දිනය : 2008.05.05
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 2/66ජේ., දුම්රියපොල පාර, ගොඩගම, හෝමාගම

නීතිඥ කොඩිතුවක්කු ආරච්චිගේ මනෝජිනී හේමමාලි කොඩිතුවක්කු,
ලේකම්.

05-395

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි

සමාගමේ නම : මැකලම් ප්‍රින්ටිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63528, 2008.03.19
ලියාපදිංචි ලිපිනය : අංක 46/38, නවම් මාවත, කොළඹ 02.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

05-378/4

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි

සමාගමේ නම : ඊ. ඇන්ඩ් එන්. ෆුඩ් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63527, 2008.03.19
ලියාපදිංචි ලිපිනය : අංක 383, සර්පන්ටයින් පාර, කොළඹ 08.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 268961.

05-378/5

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි

සමාගමේ නම : අයිමේට්‍රික්ස් ලංකා ටෙක්නොලජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63138, 2008.02.29
ලියාපදිංචි ලිපිනය : අංක 175/15, පල්ලිය පාර, නායකකන්ද, වත්තල.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

05-378/6

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සිතුමිණ කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63482, 2008.03.17
ලියාපදිංචි ලිපිනය : අංක 246/14, දෙල්ගහවත්ත, පමුණුව, මහරගම.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

05-378/7

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : මැක්සිම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63606, 2008.03.27
ලියාපදිංචි ලිපිනය : අංක 11, දෙවන වීදිය, මාළිගාව පාර, රත්මලාන.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය - 2689618.

05-378/3

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ග්‍රීන් එන්වයරන්මන්ට් ඇන්ඩ් ෆොරෙස්ට්‍රි මැනේජ්මන්ට් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 3519, 2008.04.02
ලියාපදිංචි ලිපිනය : අංක 362, කොළඹ පාර, පැපිලියාන, බොරලැස්ගමුව

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය - 2689618.

05-378/1

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : කේ. ඩී. කේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63474, 2008.03.17
ලියාපදිංචි ලිපිනය : අංක 44, සිරිනිකේතාරාම මාවත, දලුපිටිය, කඩවත

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රට්‍රීස්(ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

05-378/2

---

### සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තරය දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | සීමාසහිත(ජනතා) ශාන්තිපුර ගැමිදිරිය සමාගම |
| ලියාපදිංචි ලිපිනය | : | ශාන්තිපුර, උණගලාවෙහෙර |
| ලියාපදිංචි අංකය | : | පී. බී. 3512 |
| ලියාපදිංචි දිනය | : | 2008.03.28 |

සමාගම් ලේකම්.

05-366/1

---

### සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තරය දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | සීමාසහිත (ජනතා) නෙලුම්වැව ගැමිදිරිය සමාගම |
| ලියාපදිංචි ලිපිනය | : | නෙළුම්වැව, සෙවණපිටිය, වැලිකන්ද |
| ලියාපදිංචි අංකය | : | පී. බී. 3511 |
| ලියාපදිංචි දිනය | : | 2008.03.28 |

සමාගම් ලේකම්.

05-366/2

## සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තරය දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) මහදමණ දකුණ ගැමිදිරිය සමාගම
ලියාපදිංචි ලිපිනය : මහදමන දකුණ, මහදමන, ඇල්ලේවැව
ලියාපදිංචි අංකය : පී. බී. 3510
ලියාපදිංචි දිනය : 2008.03.28

සමාගම් ලේකම්.

05-366/3

---

## සමාගම් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තරය දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : සීමාසහිත (ජනතා) මහදමන පෙරමග ගැමිදිරිය සමාගම
ලියාපදිංචි ලිපිනය : මහදමන උතුර, මහදමන, ඇල්ලේවැව
ලියාපදිංචි අංකය : පී. බී. 3509
ලියාපදිංචි දිනය : 2008.03.28

සමාගම් ලේකම්.

05-366/4

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනය

සමාගමේ නම : රිවි කිරණ සර්විසස්(ප්‍රයිවට්)ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 63947
ලියාපදිංචි ලිපිනය : යග්ගපිටිය, දඹුල්ල පාර, කුරුණෑගල.

05-368

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව මෙයින් දන්වමු.

සමාගමේ කලින් පැවැති නම: කොමර්ෂල් එයාර් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්
සමාගමේ අංකය : N (PVS) 39999
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කාමර අංක 3 ඒ, නිව්ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් බිල්ඩිං, 46/42, නවම් මාවත, කොළඹ 02
සමාගමේ අලුත් නම : මැක්එයාර් එක්ස්ප්‍රෙස් ප්‍රයිවෙට් ලිමිටඩ්.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-458

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව දන්වමු

සමාගමේ නම: සී. එෆ්. ද මෙල් ඇන්ඩ් සන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්
සමාගමේ අංකය : PV 63855
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 161, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02
ලියාපදිංචි කළ දිනය : 2008 අප්‍රේල් මස 17

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-459

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වමු

සමාගමේ පැරණි නම: මිෂන් ටූ ද වර්ල්ඩ්
සමාගමේ අංකය : N (A) 1479
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සමාගමේ අළුත් නම : මිෂන් ටු ද වර්ල්ඩ් - ලංකා

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-460

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම නිත්‍යානුකූලව ලියාපදිංචි කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම: එක්සයිල්සොෆ්ට් ප්‍රයිවෙට් ලිමිටඩ්
සමාගමේ අංකය : PV 63980
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ද පාක්වේ බිල්ඩිං, 5 වැනි මහල, 48, පාක් වීදිය, කොළඹ 8
ලියාපදිංචි කළ දිනය : 2008 මැයි මස 02 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-461

### 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම: ටෙරාෆෝමා (පෞද්ගලික) සමාගම
සමාගමේ අංකය : PV 63499
සංස්ථාපනය කළ දිනය : 2008.03.18
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 69/1, කින්සි පාර, කොළඹ 08.

සමාගම් අධ්‍යක්ෂක.

05-464

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම: ස්ටෆටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 63890
සංස්ථාගත කළ දිනය : 2008 අප්‍රේල් 23 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 17 ඒ, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07

05-465

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 417/04.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.03.14 දිනැති අංක 1541 දරන ගැසට් පත්‍රයේ හා .2008.03.05, 2008.03.06 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනවාකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.07.10 වැනි දින පෙ.ව. 10.30 ට කුලියාපිටිය, පන්නල පාර, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, කටුගම්පොල කෝරලේ දකුණෙහි කුලියාපිටිය නගර සභා සීමාවේ කනදුල්ල හි පිහිටි හිරිලියැද්දහේන සහ හිරිලියැද්දවත්ත යනුවෙන් හඳුන්වන හා නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද 2004.02.02 දිනැති අංක 4761 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 4761 දරන පිඹුර අනුව උතුරට: ලොට් 4 ද, නැගෙනහිරට : කලින් නාගනාදන් විසින්ද වර්තමානයේ කුරේ විසින් ද හිමිකම් කියන ඉඩම සහ කලින් නාගනාදන්

විසින්ද වර්තමානයේ නිමල් පියසිරි විසින් ද හිමිකම් කියන ඉඩමද, දකුණට: මාදම්පේ සිට කුලියාපිටිය දක්වා මහාමාර්ගයද, බස්නාහිරට: ලොට් 2 ද, මායිම්ව පර්චස් දාහතරක (අ. 0, රූ. 0, පර්. 14) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. වරිපනම් අංක 656/ඒ දරන දේපල කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 193/76 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඒ. උපාලි,
කළමණාකරු.

ලංකා බැංකුව,
කුලියාපිටිය ශාඛාව.

05-439

---

## සෙලාන් බැංකුව පීඑල්සී - හෝමාගම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිටිපන දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 1997.10.05 දිනැති අංක 651 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහකැලේ මූකලානවත්ත (කොටසක්) නමැති ඉඩමේ කැබලි අංක 2 බී ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් නවයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 39.25) ක් විශාල ගොඩනැගිලි, ගස් හා වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී. 1505/162 යටතේ ලියාපදිංචි කර ඇත. මෙම දේපල හෝමාගම පදිංචි කුරුප්පු අච්චි මනතුංගේ දෝන ශිරෝමි ශිවන්ත මනතුංග යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත. ඉහත සඳහන් දේපළ 2008 ජූනි මස 17 දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- හෝමාගම නගර මධ්‍යයේ සිට හයිලෙවල් පාරේ කි. මී. 1.6 ක් දුරින් පිහිටි පිටිපන හන්දියෙන් දකුණට ඇති මොරගහහේන පාරේ කි. මී. 5 ක් ගිය විට අදාළ දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2007.12.28 වන දින පළවී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත්වල 2007.12.18 වන දින පළවී ඇත. වීරකේසරි පුවත්පතේ 2008.01.12 වන දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු.2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් 90% ද, විකිණීම දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 -2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-2696155, 011-2572940.

05-448

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

අලවතුගොඩ, මාතලේ පාර, අංක 901 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත අවුෆ් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ වන මොහමඩ් අවුෆ් අබ්දුල් කරීම් මහතා විසින් උකස් කරන ලද දේපල.

බැඳුම්කර යොමු අංකය : 58/03.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.04.01 දිනැති අංක 1387 දරන *ගැසට් පත්‍රයේ* හා 2005.03.28 දිනැති දිනමිණ, තිනකරන් හා ඩේලි නිවුස් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය, ගාස්තු හා එහි ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපොල හා පරිශ්‍රය පිහිටි ස්ථානයේදී 2008.06.19 වෙනි දින පෙරවරු 11.30 ට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව උඩ ගම්පහ අලවතුගොඩ හි පිහිටි, බලයලත් මිනින්දෝරු තැන වන එච්. පානබොක්ක මයා විසින් සාදන ලද අංක 454 දරන පිඹුරේ කැබලි 1 හා 2 යනුවෙන් පෙන්නුම් කර ඇති, 'අම්බලන්පිටියේ වත්තේ කොටසක්' යැයි හඳුන්වනු ලබන ඉඩමේ කැබලි වන, උතුරු නැගෙනහිරට : කැබැල්ල 1 හි කොටසක් ද, දකුණු - නැගෙනහිරට : කැබලි අංක 05 හා මාතලේ පාර ද, දකුණු - බස්නාහිරට : කැබලි 3 හා 4 ද, උතුරු - බස්නාහිරට : මාතලේ ට යන පී. ඩබ්. ඩී. පාර ද මායිම් වූ, පර්චස් දහයයි දශම හතයි පහක (අක්. 0, රූ. 0, පර්. 10.75) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය හා එහි තුළ පිහිටි සෑම සියළු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 351/298 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පරිදි හාරිස්පත්තුව, උඩ ගම්පහ අලවතුගොඩ හි පිහිටි බලය ලත් මිනින්දෝරු තැන වන ඩබ්. ඒ. පියදාස මයා විසින් සාදන ලද 1999.04.21 වෙනි දිනැති අංක 113/3/99 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති අම්බලන්පිටියේ වත්තේ කොටසක් යැයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන, උතුරු - නැගෙනහිරට : අංක 454 දරන පිඹුරේ කැබලි අංක 01 ද, නැගෙනහිරට : මාතලේ ට යන පාර ද, දකුණු නැගෙනහිරට : අංක 454 දරන පිඹුරේ අංක 5 දරන කැබැල්ල ද, දකුණු - බස්නාහිරට : අංක 454 පිඹුරේ කැබලි අංක 3 ද, උතුරු බස්නාහිරට : අංකුඹුර සිට මාතලේට යන පාර ද මායිම් වූ, පර්චස් නවයයි දශම දෙකයි පහක (අක්. 0, රූ. 0, පර්. 9.25) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ පිහිටි ගොඩනැගිල්ල හා සෑම සියළු දේ ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 395/200 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

05-441

---

**සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බොරැල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2006.08.28 දින සහ අංක 2757 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙබුවන්ගේ නිහාල් ප්‍රනාන්දු සහ අජන්ත ප්‍රබාන්ති ගුණතිලක ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008 ජුනි මස 12 වැනි දින පෙ.ව. 11.00ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ඒකකයේ, තලංගම පිහිටි ගොඩපොරගහවත්ත නමින් හඳුන්වන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට බලයලත් මානක ඩී. ටී. ඒ. දිසානායක විසින් මැන සාදන ලද 2003.06.18 දිනැති අංක 1660 දරන පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කරන ලද ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සහ ඉහත කී අංක 2757 දරන පිඹුරේ දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය : පර්චස් 07 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.29 වැනි දින දරන *ගැසට් පත්‍රය* හා 2007.08.14 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු.2,000) ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සී/ස. හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121

05-435